# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2263/20 - 2022 ජනවාරි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

වර්ෂ 1989 අංක 12 දරන පළාත් සභා (ප්‍රාසංගික විධිවිධාන) පනතේ 2(1) (අ) කොටස් හා බැඳුණු 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වැනි කොටස යටතේ වන ආඥාව

උතුරු පළාත් ආණ්ඩුකාරවර ජීවන් ත්‍යාගරාජා වන මම, 1989 වර්ෂයේ අංක 12 දරන පළාත් සභා ප්‍රාසංගික විධිවිධාන පනතේ 2(1)(අ) කොටස හා බැඳි 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වැනි කොටස යටතේ සඳහන් විධිවිධානයන්ට අනුව මට පවරා ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් ආඥාව මෙයින් දැනුම් දෙමි.

**ජීවන් ත්‍යාගරාජා,**
ආණ්ඩුකාරවර,
උතුරු පළාත.

2022 ජනවාරි මස 13 වැනි දින,
ආණ්ඩුකාරවර කාර්යාලය,
උතුරු පළාත.

### නියෝගය

මන්නාරම ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂය සඳහා වූ අය වැය වාර්තාව 2021.12.31 වැනි දිනට නිම නොකිරීම හේතුවෙන් 2022.01.01 දින සිට 2022 වර්ෂයට අදළ අයවැය වාර්තාව සභාවට ඉදිරිපත් කොට සභාව විසින් එකගත්වය පළකරන තෙක් මන්නාරම ප්‍රාදේශීය සභාවේ සභාපති, මොහොමඩ් ඉස්මයිල් මොහොමඩ් ඉසදීන් මහතාට 2022 වර්ෂයට අදළ අපේක්ෂිත වියදම් තක්සේරුව අනුව පහත සඳහන් වියදම් පමණක් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දෙමි.

1. වැටුප් හා පඩිනඩි
2. ගමන් වියදම්
3. පැටවීම් බැම් විදුලි සංදේශ හුවමාරු හා ප්‍රයෝජනවත් සේවා
4. සැපයුම් භාණ්ඩ හා අවශ්‍ය භාණ්ඩ

EOG 01 - 0205